**30-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ශිව බාබා විසින් නිර්මාණය කරන ලද මෙම ගිනි යාගය ඔබලා රැක බලා ගත යුතුයි. ස්වාධිපත්‍යය ලබා ගැනීම සඳහා වන අසීමිත ගිනි යාගය මෙයයි.

**ප්‍රශ්නය:** මෙම යාගය කෙරෙහි ගෞරවයක් ඇත්තේ කුමන දරුවන්ටද?

**පිළිතුර:** මෙම රුද්‍ර ඥාන යාගයේ වැදගත්කම දන්නා දරුවන් මෙමගින් තමන් සිප්පි කටුවකින් දියමන්තියක් බවට පත් වන බව තේරුම් ගෙන සිටිනවා. මුළු පැරණි ලෝකයම මෙයට බිලි දිය යුතුයි. ඔබගේ පැරණි ශරීර පවා මෙයට බිලි දිය යුතුයි. එවන් අවධානයක් යොමු කළ විට පමණයි ඔබට ඒ කෙරෙහි ගෞරවයක් ඇති වන්නේ.

**ගීතය:** මව්නි, මව්නි, මුළු ලෝකයටම වාසනාව දානය කරන්නා ඔබයි!

ඕම් ශාන්ති. ඔය දරුවන්ට ගීතය ඇසුණා. ගීතය රචනා කළ ඒ අසරණයින් මේ මව යි කියන්නේ කවුදැයි කියාවත් දන්නේ නැහැ. ජගදම්බා යන නම ඔවුන් අසා තිබුණත් ඒ කවුද, මොනවාද කළේ, කොයි කාලේ ද සිටියේ කියා කිසිම දෙයක් ඔය දරුවන් හැර වෙන කිසිම කෙනෙක් දන්නේ නැහැ. ලෝක මාතාවක් සිටිනවා නම් අනිවාර්යෙන්ම පියෙක් හා දූ දරුවනුත් සිටිය යුතුයි. ජගදම්බා ළඟට යන අයගේ බුද්ධියේ මෙම අවධානය නැහැ. ඔවුන් කරන්නේ පිළිමය වන්දනා කිරීම පමණයි. ඔවුන් දෙවඟන ඉදිරියේ යාදිනවා. ස්ව ආධිපත්‍යය ලබා ගැනීම සඳහා අශ්වයාව බිලි දෙන අවිනාශී ඥාන යාගය මෙයයි. එහි නිර්මාණකරු වන්නේ මවයි, පියායි. එයම ඔබටද අදාල වෙනවා. ඔබලාත් මෙම යාගයේ නිර්මාණකරුවන් වෙනවා. ඔබ මෙම යාගය ඉතාමත් හොඳින් රැක බලා ගත යුතුයි. මෙම යාගය කෙරෙහි විශාල ගෞරවයක් ඔබ තුළ තිබිය යුතුයි. යාග ගින්නක් ඉතාමත් හොඳින් රැක බලා ගන්නවා. මෙය ප්‍රධාන කාර්යාලය වන අතර එහි ශාඛා රැසකුත් තිබෙනවා. මෙම යාගයෙන් මමාත් බාබාත් ඔය දරුවනුත් අනාගතයේදී දියමන්ති හා සම වෙනවා. එමනිසා, එවන් යාගයක් ඔබලා ලොකු සෙනෙහසකින් හා ගෞරවයකින් රැක බලා ගත යුතුයි. ඒ කෙරෙහි ලොකු සෙනෙහසක් තිබිය යුතුයි. මේ අපේ මාමාගේ, ජගදම්බාගේ ගිනි යාගයයි. මමා හා බාබාගේ යාගය අපේත් යාගයයි. මෙම යාගය තව තවත් දියුණු විය යුතුයි. එවිට තවත් බොහෝ පිරිසකට මෙහි පැමිණ තම උරුමය දිනා ගත හැකියි. වේලාවක් නැතැයි කියමින් ඇතැම් අය ආරාධනා පත්‍ර පිළිගන්නේ නැහැ. එවිට ඒ ආරාධනා පත්‍ර අන් අයට දිය යුතුයි. මෙහි නම ම වන්නේ ස්වාධිපත්‍යය සඳහා වන ඥාන යාගය යන්නයි. ඔබගේ පැරණි ශරීරයත් ඔබගේ මෙම යාගයට බිලි දිය යුතුයි. පරමාත්ම පියාට අයිති වන්න. ගිනි යාගය යනු ගොඩනැගිල්ලක් නොවෙයි. මෙය අසීමිත කරුණක්. මුළු ලෝකයම බිලි දිය යුතු යාග ගින්න මෙයයි. ඔබ තව තවත් දියුණු වන විට මෙම යාගයට කෙතරම් නම් ගෞරවයක් ඇති විය හැකිදැයි කියා ඔබට දැකගත හැකියි. මෙහි සිටිනා බොහෝ දෙනාට ගෞරවයක් නැහැ. මෙම යාගයට අයත් දරුවන් රැසක් සිටිනවා. දිගටම දරුවන් ඉපදෙනවා. මෙම යාගය කෙරෙහි මහත් ගෞරවයක් තිබිය යුතුයි. නමුත් එය අගය නොකරනා බොහෝ දෙනා සිටිනවා. සිප්පි කටු වන් මිනිසුන්ව දියමන්ති කරවන, දූෂිත වූවන් උතුම් කරවන මහා ගිනි යාගය මෙයයි. මෙන්න මේ නිසා තමයි බාබා කියන්නේ: ඔබ නොකඩවාම යාග නිර්මාණය කරාවි. ඉන් එක් අයෙක්වත් මෙමගින් උසස් අයෙක් වෙනවා නම් එය ඔහුගේ මහා වාසනාවයි. දේවාල සිය දහස් ගණනක් තිබෙනවා. ඉන් කිසිම කෙනෙක් උසස් වන්නේ නැහැ. ඔබට තිබිය යුත්තේ වර්ග අඩි තුනක ප්‍රමාණයක් පමණයි. මෙහි පැමිණෙන ඕනෑම කෙනෙකුට තම ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් කර ගත හැකි විය යුතුයි. මෙම යාගය කෙරෙහි විශාල ගෞරවයක් තිබිය යුතුයි. බොහෝ දරුවන් බාබාට ලියනවා: බාබා, මම මෙවන් යාගයක් මගේ ගෙදර ආරම්භ කරන්න ද? බාබා කියනවා: හොඳයිනේ දරුවෝ, එතැනත් යාග භූමියක් කර ගන්න. කවුරු හෝ සෙතක් සලසා ගනීවි. මේ යාග ගින්නේ මහා වැදගත්කමක් තිබෙනවා. දරුවන් නොකඩවා අන් අයට සෙත සලසන යාග භූමිය මෙයයි. එවන් යාගයක් කෙරෙහි ලොකු ගෞරවයක් තිබිය යුතුයි. නමුත් වැඩි දැනුමක් නොමැතිකම නිසා ඔවුන් එයට ගරු කරන්නේ නැහැ. ගිනි යාගයට බාධා එල්ල කරන අයත් රැසක් සිටිනවා. මෙය ශිව බාබාගේ ගිනි යාගයයි. මවත් පියාත් සිටින්නේ එකටයි. මේ මමා හෝ බාබාගෙන් ඔබට කිසිවක් ලැබෙන්නේ නැහැ. ඔබට ලැබෙනා සෑම දෙයක්ම ලැබෙන්නේ අසීමිත පියාගෙනි. ඔහු පමණයි එකම කෙනා. මමා හෝ බාබා ශාරීරික අයයි. අශාරීරික කෙනාට තමාටම කියා ශරීරයක් නැහැ. එමනිසා පරමාත්ම පියා කියනවා: භෞතික කෙනාගේ වහලෙක් වන්න එපා. නිරන්තරයෙක් මා පමණක් සිහි කරන්න. මේ බාබාත්

මාව සිහිපත් කරනවා. මිනිස්සු පින්තූර වලින් පෙන්වන රාමා, ක්‍රිෂ්ණා, බ්‍රහ්මා ආදි අයව සිහි කරනවා. කෙසේ වෙතත්, ඒක එහෙම නැහැ. එහිදී කිසිම කෙනෙක් කිසිම කෙනෙක්ව සිහි කරන්නේ නැහැ. තම තමන්ගේ ලාභය ලබා ගැනීමෙන් පසු තවත් කෙනෙක්ව සිහි කළ යුත්තේ කුමකටද? අපි අපිරිසිදු වෙලා. එමනිසා අප පාරිශුද්ධ වීමට ඔහුව සිහි කළ යුතුයි. ප්‍රශංසාව එක් අයෙක් පිළිබඳවයි. මොහුව ප්‍රශංසාවට ලක් වන්නේත් ඔහු නිසායි. ඔබ කිසිම ශාරිරික කෙනෙක්ව සිහි කළ යුත්තේ නැහැ. ඔහුගේ හැඳින්වීම ඔබ ලබන්නේ ශාරීරික කෙනෙක් හරහායි. ඒ වුණත් ඔබ සිහි කළ යුත්තේ ඒ කෙනාවයි. බාබාත් ශාරීරික අයෙකි. ඔහු (ශිව බාබා) සෑම කෙනෙකුගේම හැඳින්වීම ලබා දෙනවා. කෙසේ වෙතත්, තමන්ට සිතිවිලි බලයෙන් ඍජුවම ශිව බාබාගේ ඥානය ලබා ගත හැකියි කියා කියනා අඥාන දරුවන් රැසකුත් සිටිනවා. ඒක එහෙම නම් ඔහු මෙම රථයෙන් මෙහි ආ යුත්තේ කුමකටද? මේ ශාරිරික කෙනාත් සමඟ මට ඇති සම්බන්ධතාවය කුමක්ද කියා කියනා අය රැසකුත් සිටිනවා. මන්මනාභව, මා සිහි කරන්න. කෙසේ වෙතත්, ඔහු මෙය කියන්නේ මොහු හරහායි, නේද? ඔබ ගරුත්වය රකිනවා. සිහසුනේ අසුන් ගැනීමට නියමිතව සිටිනා අය මෙයට ගරු සැලකිලි කරාවි. රාජධානි සිහසුනේ පළමුවෙන්ම අසුන් ගන්නේ මමා හා බාබායි. පසුව ඔබලා ඔවුන් අනුගමනය කරමින් යා යුතුයි. පුරවැසියන් ගණනාවක් නිර්මාණය කර ගත යුතුයි. තත්ත්වයත් ඉතාමත්ම ඉහළයි. මෙහිදී බිය සම්බන්ධ දෙයක් නොමැත. කෙනෙකුට පළමු වතාවට ගුවන් යානාවක යාමට සිදු වුණු විට බය වෙනවා. ඇතැම් අය හඳටත් යනවා. එය පුහුණුව සම්බන්ධ කරුණකි. කෙසේ වෙතත්, එමඟින් කිසිම යහපතක් සිදු වන්නේ නැහැ. මෙය තේරුම් ගන්නේ ඔබ පමණයි. තමන්ට හඳේත් තම රාජධානිය ස්ථාපනය කර ගත හැකියි කියා ඔවුන් සිතනවා. ඒ වුණත් එවන් දෙයක් සිදු වන්නේ නැහැ. ඔය දරුවන්ට දැන් මේ පරිහාණිය හොඳින් තේරෙනවා. නැග්ම හා බැස්ම ඔය දරුවන්ට අවබෝධ වෙනවා. ලක්ෂ්මී හා නාරායන පාලනය ගෙන ගියේ කෙසේද කියා පෙන්වන පින්තූර තිබෙනවා. භාරතය අද වන විට කෙතරම් දිළිඳු වෙලාදැයි කියා බලන්න: මෙය සත්‍ය දෙයක්. ඒ අයම ඒ ගැන ලියා තිබෙනවා. එය ලිවිය යුත්තේ ඉනිමඟ පෙන්වන පින්තූරයේයි. එහි මාළිගා දියමන්ති වලින් බබලනවා. මෙහි ගොඩනැගිලි පෙන්වීමේදී සිප්පි කටු වලින් තමයි නිරූපනය කළ හැකි වන්නේ. ඒ දිනවල සිප්පි කටු තිබුණා. සීක් ජාතිකයින්ගේ දේවාලයේ සිප්පි කටු තබා තිබුණා. අද කාලයේ මුදල්වත් එසේ තබන්නේ නැහැ. ඉනිමඟ පින්තූරය ඉතාමත් හොඳයි. එහි බොහෝ දේ ලිවිය හැකියි. මමා හා බාබා සමග දරුවන්ද සිටිනා පින්තූරයකුත් තිබිය යුතුයි. ඉහළින් ජීවාත්මයන් සිටිනා ගසකුත් තිබිය යුතුයි. සෑම දිනකම අලුත් පින්තූර සෑදෙමින් පවතිනවා. පරිහානිය සිදු වන්නේ කෙසේද නැවතත් නැග්ම සිදු වන්නේ කෙසේද කියා පෙන්වා පැහැදිලි කිරිම ඉතාමත් පහසුයි. අපි අශාරීරික ලෝකයට ගිහින් පසුව එතැනින් ශාරීරික ලෝකයට පැමිණෙනවා. මෙය පැහැදිලි කිරිම ඉතාමත් පහසුයි. කෙනෙකුට මෙය තේරෙන්නේ නැතිනම් එය ඔහුගේ වාසනාවේ නොමැති බව ඔබට අවබෝධ කර ගත හැකියි. නාටකය දෙස බැලිය යුත්තේ නොබැඳි නිරීක්ෂකයෙකු ලෙසිනුයි. මෙම යාග ගින්න කෙරෙහි ඔය දරුවන් තුළ මහත් ගෞරවයක් තිබිය යුතුයි. මවගේ හා පියාගේ අවසරයෙන් තොරව මෙම යාග යගියාවෙන් එක් සතයක් හෝ ගෙන තවත් කෙනෙකුට දුන්නොත් එය මහා විශාල පාපයක්. ඔබලා දරුවන් නිසා ඔබලාට අවශ්‍ය දේවල් ඕනෑම වෙලාවක සැපයිය හැකියි. තමන්ට අවශ්‍ය පමණට වඩා වැඩියෙන් තියා ගන්නේ ඇයි? පසුවට නැති වෙයි කියා ඔබ හිතනවාද? ඒ වුණත් එසේ යම් දෙයක් තමා සතු කරගෙන සිටීමෙන් තමන් වරදක් කරනා බව තමන්ම දන්නා නිසා ඔබගේම සිත ඔබට වද දේවි. ඔබට අවශ්‍ය ඕනෑම දෙයක් ඕනෑම මොහොතකදී ගත හැකියි. පරමාත්ම පියා කියනවා: අවසානයේදි ඕනෑම කෙනෙක් හදිසියේම මිය යා හැකියි. කුමනකාරයේ පාප කර්මයක් ඔබ විසින් කළත්, අවසන් මොහොතේදී ඒ කුණු කසල සියල්ල ඔබ ඉදිරියේ මැවී පෙනේවි. මෙන්න මේ නිසා තමයි බාබා සෑම විටම පැහැදිලි කරන්නේ: තමා තුළ කිසිම ආකාරයක පටලැවිල්ලක් තබා ගන්න එපා. ඔබගේ හදවත පිරිසිඳු නම් අවසන් මොහොතේදී ඔබ ඉදිරියේ කිසිම දෙයක් ඉස්මතු වන්නේ නැහැ. ඔබට අවශ්‍ය සෑම දෙයක්ම යගියාවෙන් දිගටම ලැබෙනවා. බොහෝ මුදල් තිබෙනා දරුවන් රැසක් සිටිනවා: ඔවුන්ට කියා තිබෙන්නේ: අවශ්‍යතාවයක් ඇති වුණු විට මම ඉල්ලන්නම්. ඔවුන් කියනවා: බාබා ඕනෑම අවශ්‍යතාවයකදී ඒ සියල්ල සැපයීමට අප මෙතැන සිටිනවා. ඔවුන් පාරිශුද්ධව නොසිට ආහාර පාන සම්බන්ධයෙන් වුවත් සැලකිල්ලක් නොමැති වුවත්, තමා සතු සියලුම ධනය බාබාට කැප කරනවා: බාබා මට ගොඩාක් සල්ලි තිබෙනවා. ඒවා නිකම්මයි තිබෙන්නේ. අනිත් අය ඒවා කා දමාවි. ඒ නිසා, ඔබට ඕනෑ කරන ඕනෑම වෙලාවක ඉල්ලන්න. බාබා කියනවා: මම මොනවා කරන්නද ඒවා අරගෙන? ගොඩනැගිලි සෑදිය යුතුව තිබෙනවා නම් මුදල් නිකම්ම එනවා. තම තමන්ගේම නිවෙස් වලට වී සිටිනා දරුවනුත් සිටිනවා. එවන් දරුවනුත් උසස් තත්ත්වයක් දිනා ගන්නවා. පුරවැසියන්ගේ තත්ත්වයත් දෙවැනි නැහැ. බොහෝ ධනවතුන් රජවරුන්ටත් වඩා ධනවත්. මෙන්න මේ නිසා එවන් සිතිවිලි තබා නොගත යුතුයි. ඔබ පොරොන්දුවක් වුණා:

බාබා ඔබ අපට මොනවා කන්න දුන්නත්... නමුත් එය හරිහැටි පිළිපැද්දේ නැතිනම් පරිහාණියත් වෙනවා. පරමාත්ම පියා පැමිණ සිටින්නේ විමුක්තිය දානය කිරීමටයි. ඔබ ඉහළ තත්ත්වයක් දිනා ගත්තේ නැතිනම් එය හඳුන්වන්නේ පරිහාණිය ලෙසයි. එහිත් ධනවත් අය රාශියක් සිටිනවා. ඇතැම් අය ඉහළ තත්ත්වයක් දිනා ගන්නා අතර අනිත් අය දිනා ගන්නේ පහළ තත්ත්වයකි. ඔය දරුවන් උත්සාහ දැරිය යුත්තේ ශ්‍රීමත් වලට අනුකූලවයි. තමාගේම මත පිළිපැදීමෙන් ඔබ ඔබවම රවටා ගන්නවා. මෙය ශිව බාබා විසින් නිර්මාණය කරන ලද ඥාන යාගයයි. ස්ව ආධිපත්‍යය දිනා ගැනීම සඳහා අශ්වයාව බිල්ලට දෙන අවිනාශී ගිනි යාගය කියන්නේ මෙයටයි. ශිව බාබා පැමිණ ඔබට ස්ව ආධිපත්‍යය පිරිනමනවා. වාසනාවේ නොමැති නම් නම කීර්තිමත් කිරීමට යන්නේ නැතිනම් ඔවුන්ගේ දෙතොලින් හොඳ කරුණු මතු වන්නේ නැහැ. ඒ නිසා ඔවුන් කිසිම කෙනෙකුට පැහැදිලි කරන්නේත් නැහැ. නමට කීර්තියක් ඒමට නම් තව බොහෝ කල් යයි කියා එවිට කියාවි. මේ නිසා අන් අයට පැහැදිලි කිරීමේදීත් ඔබ ප්‍රධාන කරුණු අමතක කර දමනවා. එයත් පැහැදිලි කළ යුතුයි: ස්වාධිපත්‍යය දිනා ගැනීම සඳහා අශ්වයා බිල්ලට දෙන රුද්‍රාගේ අවිනාශී යාග ගින්න මෙයයි. පුවරුවක වුවත් මේ ගැන ලිවිය හැකියි: මුළු පැරණි ලෝකයම මෙම යාග ගින්නට බිලි වුණු විට මහා භාරත යුද්ධය ඔබ ඉදිරියටස පැමිණේවි. විනාශයට පෙර තම ස්වාධිපත්‍යය දිනා ගැනීමට අවශ්‍ය නම් ඇතුළට පැමිණ එය දිනා ගන්න. දැන්වීම් පුවරු වල බොහෝ දේ ලිවිය හැකියි. අරමුණ හා ඉලක්කයත් එහි අන්තර්ගතයි. පහළින් ලියන්න: ස්වාධිපත්‍යය ඔබට දිනා ගත හැකියි. ලියන සෑම දෙයක්ම එය කියවනා ඕනෑම කෙනෙකුට පහසුවෙන් තේරුම් ගත හැකි පරිදි පැහැදිලිව ලිවිය යුතුයි. බාබා ඔබට උපදෙස් දෙනවා. එවන් පුවරු සාදන්න. අනිවාර්යෙන්ම මෙම වචන ලියන්න. තවදුරටත් ඉදිරියට යන විට, මෙම යාග ගින්නේ විශාල බලපෑමක් ඇති වේවි. කුණාටු ගණනාවක් ඇති වේවි. සත්‍යයේ ඔරුව ගල්පර වල වැදුණත් කවදාවත් ගිලෙන්නේ නැත කියා කියා තිබෙනවා. ඔබ කිරි සයුරට යා යුතුයි. එමනිසා, ඔබගේ හදවත වස සයුරේ බැඳී නොතිබිය යුතුයි. දැනුම ගන්නේ නැති අය පසුපස හඹා යමින් ඔබගේ කාලය අපතේ නොහරින්න. පැහැදිලි කිරීම ඉතාමත් පහසුයි. වන්දනීය දේවතාවරුන්ව සිටි ඔබලා දැන් වන්දනාකරුවන් වෙලා. පරමාත්ම පියා කියනවා: නිරන්තරයෙන් මා පමණක්ම සිහි කරන්න. සෑම කහටක්ම මැකී යාවි. ඔබගේ පව් පිළිස්සී යාවි. වෙන කිසිම ක්‍රමයක් නැහැ. නිවැරදිම ක්‍රමය මෙයයි. කෙසේ වෙතත්, ලොකු ශාරීරික අවධානයක් ඇති නිසා ඔබ යෝගාවේ සිටින්නේ නැහැ. ශාරීරික අවධානය අවසන් වුණු විට ඔබට යෝගාවේ සිටිය හැකි වේවි. එවිට ඔබ ඔබගේ කර්මාතීත් තත්ත්වයට ළඟා වේවි. අවසානයේදී ඔබ කිසිම දෙයක් සිහි නොකළ යුතුයි. ඇතැම් දරුවන් යම් යම් දේ කෙරෙහි මහා බැඳීමකින් සිටිනවා. ඒ ගැන නම් අහන්නවත් එපා. ඔවුන් ශිව බාබාව සිහි කරන්නේම නැහැ. මෙවන් පියෙක්ව වුවමනාවෙන්ම සිහි කළ යුතුයි. කරන වැඩය දැතට පවරා සිතෙන් ශිව බාබාව සිහි කරන්නයි කියා කියනවා. අහම්බෙන් කෙනෙකුට තමයි මේ ලෙසින් බාබාව සිහි කළ හැකි වන්නේ. ඔවුන්ගේ හැසිරීමෙන් සියල්ලම කිව හැකියි. යාග ගින්න කෙරෙහි ඔවුන්ට කිසිම ගෞරවයක් නැහැ. මේ කාලයේදී මෙම යාග ගින්න හොඳින් රැක බලා ගත යුතුයි. රැක බලා ගන්නවා යනු බාබාව සතුටු කරවීමයි. සෑම කරුණක් සම්බන්ධයෙන්ම ප්‍රවේශම් විය යුතුයි. දුප්පතුන් තමා සතු සෑම සතයක්ම මෙම යාගයට දමා කෝටිපතියන් විය යුතුයි. කිසිම දෙයක් නැති අම්මලා සිටිනවා. ඒ වුණත් ඔවුන් රුපියලක් දෙකක්, සත පනහක් යාගය වෙනුවෙන් පිරිනමා කෝටිපතියන් වෙනවා. ඒ ඔවුන් ලොකු සෙනෙහසකින් භක්ති පූර්වක හැඟීමෙන් සතුටින් එය ගෙනෙන නිසායි. පරමාත්ම පියා කියනවා: මම දුප්පතුන්ගේ ස්වාමියායි. මා පැමිණ සිටින්නේ ඔය දරුවන් වෙනුවෙනුයි. ඇතැම් අය සත පනහක් ගෙනැවිත් කියනවා: බාබා මගේ නමින් ගොඩනැගිල්ලට එක ගඩොලක් තබන්න. ඇතැම් විට ඔවුන් සහල් මිටි දෙකක් පවා ගෙනෙනවා. ඒ වෙනුවට ඔවුන්ට ඉහළින්ම ලැබෙනවා. හැම හාල් ඇටයක්ම එක රත්තරන් කාසියකට සමානයි. දුප්පතුන්ට දෙන්න ඕනේයි කියා දෙයක් නැහැ. අනිත් අය දුප්පතුන්ට දාන මාන දෙනවා. එවනු දුප්පතුන් රාශියක් ලෝකය පුරාම සිටිනවා. ඒ සෑම කෙනෙක්ම මෙහි ඇවිත් වාඩි වුණොත් අපේ ඔළුවත් කා දමාවි. බොහෝ අය මෙම යාගයට භාර වීමට අහනවා. කෙසේ වෙතත්, ඔවුන්ව පිළිගත යුත්තේ ලොකු සැලකිල්ලකින්. යාගයට පැමිණ පසුව ප්‍රශ්න ඇති කරනා අය නොවිය යුතුයි. යාග ගින්නේදී ඔබලා ඉතාමත් පින්වත් අය විය යුතුයි. ඉතාමත් සැලකිලිමත් විය යුතුයි. අපගේ ශාරීරික ජීවිකාව රැකෙනා මෙම යාගය කෙරෙහි විශාල ගෞරවයක් තිබිය යුතුයි. යාගයට අයිති මුදලක් තවත් කෙනෙකුට දෙනවා යන්න විශාල පාපයක්. මෙම මුදල් ඇත්තේ සිප්පි කටුවකින් දියමන්තියක් වෙමින් සිටිනා අයටයි. පරමාත්ම දේව සේවයේ නිරතව සිටිනා අයටයි. කෙසේ වෙතත්, උපතක් උපතක් පාසා දුප්පතුන්ට දන් දීම පින් දහම් කිරීම සිදු වෙමින් පැවතියා. පහළට පැමිණීමත් සමඟ ඔබ තව තවත් පාපකාරි ජීවාත්මයන් වීම පමණයි සිදු වුණේ. පරමාත්ම පියාගේ හැඳින්වීම දිමට ඔබලා කුඩා ගම්මාන වලත් ප්‍රදර්ශන පවත්වනවා. එක් දුප්පත් කෙනෙක් හෝ මතු වුණහොත් ඒකත් ඉතාමත්

හොඳයි. එයට කිසිම වියදමක් යන්නේ නැහැ. ලක්ෂ්මී නාරායන තම තත්ත්වය දිනා ගත්තා. ඔවුන්ට කිසිම වියදමක් දැරීමට සිදු වුණාද? කොහෙත්ම නැහැ. ලෝක ආධිපත්‍යය දිනා ගැනීමට ඔවුන්ට කිසිම වියදමක් දැරීමට සිදු වුණේ නැහැ. අනිත් අය ලොකු ලොකු ගැටුම් ඇති කර ගන්නවා. පුපුරණ ද්‍රව්‍ය ආදිය කෙරෙහි ඔවුන් විශාල ලෙසින් වියදම් කරනවා. මෙහි කිසිම වියදමක් දැරීමට සිදු වන්නේ නැහැ. සිප්පි කටුවක තරම් දෙයක්වත් වියදම් නොකර ලෝක ආධිපත්‍යය එක් තත්පරයකින් දිනා ගන්න. ඇල්ෆා සිහි කළ විට අධිරාජ්‍යය බීටාව ඔබට හිමි වේ. පරමාත්ම පියා කියනවා: හැකි උපරිමයෙන් සැබෑ හදවතකින් දෙවියන්ව සතුටු කරවන්න. එවිට ඔබ සත්‍ය දේශයේ පාලකවරුන් වේවි. කිසිම මිථ්‍යා සහගත දෙයක් මෙහිදී දිගටම කරගෙන යා හැකි වන්නේ නැහැ. ඔබ බාබාව සිහි කළ යුතුයි. මම ඉතින් කොහොමත් බාබාගේ දරුවානේ කියා සිතන්න එපා. සිහි කිරීම සඳහා දැඩි උත්සාහයක් අවශ්‍යයි. කුමන හෝ පාපකාරී ක්‍රියාවක් කළහොත් ඉන් විශාල හානියක් සිදු වෙනවා. ඔබගේ බුද්ධියට ස්ථාවරව සිටිය නොහැකි වේවි. බාබාට මේ සම්බන්ධ අත්දැකීම් තිබෙනවා. බාබා නිතර නිතරම කියන්නේ ඇතැම් දරුවන් සිතාගෙන සිටින්නේ තමන් හරිම දක්ෂයින් කියලයි. ඒ වුණත් බාබා කියනවා: විශාල උත්සාහයක් අවශ්‍යයි. මායා විවිධාකාර බාධක ගෙන එනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම රුද්‍ර ඥාන යාගය කෙරෙහි ඔබ තුළ මහත් ගෞරවයක් තිබිය යුතුයි. ඉතාමත් පිරිසිඳු හා බලවත් වාතාවරණයක් මෙම යාගය තුළ නිර්මාණය කිරීමට සහයෝගශීලී වන්න. ලොකු සෙනෙහසකින් එය රැක බලා ගන්න.
2. කිසිම දෙයක් තමා තුළ සඟවා තබා ගන්න එපා. හදවත පිරිසිදු නම් ඔබගේ සෑම ආශාවක්ම ඉටු වනු ඇත. මෙම යාගයේ සෑම පැන්සයක්ම වටිනාකමින් ඉතාමත් ඉහළයි. එමනිසා, එක් සිප්පි කටුවක්වත් අපතේ හරින්න එපා. සහයෝගශීලී වී යාගය තවත් දියුණු කර ගන්න.

**වරදානය:** ඔබ නිරතුරුවම තුන් කාලය ඔබ ඉදිරියේ තබාගෙන ඔබ සිදු කරන සෑම කාර්යයකින්ම ජයගෙන සාර්ථක වේවා.

ලෝකයේ නුවණ ඇති අය, ඔනෑම පියවරක් ගැනීමට පෙර සෑම දේකම මුල සහ අවසානය ගැන සලකා බලයි. ඒ අන්දමින්ම, මෙහිදීද, ඔය දරුවන් ඔනෑම ක්‍රියාවක් සිදු කිරීමට පෙර, පලමුවෙන්ම තුන් කාලයම ඔබ ඉදිරියේ තබාගෙන ඉන්පසුව ක්‍රියා කරන්න. වත්මන් කාලය දෙස පමණක් නොබලන්න, නමුත් ජයග්‍රහණය පිලිබඳ විශ්වාසය තිබීමේ සහ තුන් කාලය පිලිබඳව දැන සිටීමේ පදනමින්, අසීමිත වැටහීමක් ඇතිව, සෑම ක්‍රියාවක්ම සිදු කරන්න, සෑම වචනයක්ම පවසන්න. එවිට ඔබ ආධ්‍යාත්මික සහ සාමාන්‍ය නොවන බව කියයි.

**පාඨය:** සීමිත ආධාරක වලින් ඉවත් වී, ඒකායන පියාව ඔබගේ එකම ආධාරකය කරගන්න, එවිට ඔබට එතෙර වීමට හැකි වෙයි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබගේ විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන් හිඳින්න.**

සමහර දරුවන් සිතන්නේ, ඔවුන් තමන් ගැන දන්නා බවත් ඔවුන් හොඳින් සිටින බවත්, වෙන අය ඔවුන් ගැන නොදන්නවා මෙන්ම ඔවුන්ව නොහඳුනන නමුත් යථා කාලයේදී ඔවුන්ව හඳුනාගන්න බවයි. ඉතිං

ඔබ ඉදිරියට යත්ම සිදුවන්නේ කුමක්ද කියා බලන්න. මෙම දැනුමේ ප්‍රතිමූර්තියක් සහ ස්මරණයේ ප්‍රතිමූර්තියක් වන ජීවාත්මයකට එය, මිහිරි නොසැලකිල්ලලේ නින්දකි. තම විශ්වාසයේ අත්තිවාරම ශක්තිමත් දරුවන්ව කිසිවිටෙක සැගවිය නොහැක. ඔවුන් නිරන්තරයෙන් නොබියව සහ සැහැල්ලුවෙන්

රැඳී සිටියි.